ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2016.12 07 |
|---|---|---|---|---|---|

## ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 03-2016

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>නිල වාහන සැපයීම වෙනුවට මාසික ප්‍රවාහන දීමනාව ගෙවීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2016 හා 2016.03.09 දිනැති ලිපිය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2016(I) හා 2016.09.07 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛ වල පිටපත් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8-4 සහ 2016.05.11 හා 2016.11.07 දිනැති ලිපි මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03.2016.09.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2016(I) අනුව මේ සම්බන්ධයෙන් නිකුත් කළ 2016.03.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2016හි 02 ඡේදයේ (i) අනු ඡේදය පහත පරිදි සංශෝධනය කිරීමට 2016.08.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති අතර මෙම විධිවිධාන 2016.08.09 දින සිට බලාත්මක වන බවත් සඳහන් වේ.

i. ප්‍රවාහන දීමනාව ලබා ගැනීමට පාවිච්චි කරනු ලබන වාහනය නිලධරයාගේ හෝ සිය කලත්‍රයාගේ නමින් ලියාපදිංචි කර තිබිය යුතුය.එතෙකුදු වුවත් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා පෞද්ගලිකව සෑහීමකට පත් වන්නේ නම්, නිලධරයා විසින් කුලී පදනම මත හෝ බදු පදනම මත හෝ පාවිච්චි කිරීමට ගනු ලබන වාහනයක් වෙනුවෙන්ද මෙම මාසික ප්‍රවාහන දීමනාව ගෙවිය හැකිය.

04.ඒ අනුව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් මාසික ප්‍රවාහන දීමනාවක් සඳහා හිමිකම් ලබන නිලධරයන් සඳහා එකී මාසික දීමනාව ගෙවීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2016 හා 05/2016(I) හි සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.

| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office | 091 2234052 / 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site | www.cs.sp.gov.lk |
|---|---|---|---|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2016

මගේ අංකය: EST-7/TPORT/05/5011
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2016.03.09

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>නිල වාහන සැපයීම වෙනුවට මාසික ප්‍රවාහන දීමනාව ගෙවීම.</u>

2007.08.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2007, 2007.10.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2007 සහ 2008.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2008 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ඉහත චක්‍රලේඛ අනුව මාසික ප්‍රවාහන දීමනාවක් සඳහා හිමිකම් ලබන නිලධරයන් සඳහා එකී චක්‍රලේඛ විධිවිධාන අනුව ගෙවනු ලබන රු.30,000/- මාසික ප්‍රවාහන දීමනාව, 2016 අයවැය යෝජනා අනුව **2016.01.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත කොන්දේසි හා නියමයන්ට යටත්ව රු.50,000/- ලෙස සංශෝධනය කෙරේ.

i. ප්‍රවාහන දීමනාව ලබා ගැනීමට පාවිච්චි කරනු ලබන වාහනය නිලධරයාගේ හෝ සිය කලත්‍රයාගේ නමින් ලියාපදිංචි කර තිබිය යුතුය.

ii. ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධරයෙකු තනිව සහභාගී විය යුතු සේවා ස්ථානයෙන් බැහැර රාජකාරියක් සඳහා යාමට හෝ පෞද්ගලික කටයුත්තක් සඳහා හෝ රජයේ වාහනයක් භාවිතා නොකළ යුතුය .

iii. ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධරයකු විශේෂ රාජකාරී සඳහා සේවා ස්ථානයෙන් බැහැර ප්‍රදේශයන්හි රාජකාරීවල නිරත කරවීමට සිදුවන අවස්ථාවලදී එකී රාජකාරීන්හි නිරතවීම වෙනුවෙන් අතිරේක ඉන්ධන සැපයීම වෙනුවට මින් ඉදිරියට ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුව සැතපුම් කුලිය ගෙවිය යුතුය.

iv. ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධරයකු නිල වාහන හිමිකම ඇති තනතුරු එකකට වැඩි සංඛ්‍යාවක සේවය කරන විට තම නිත්‍ය තනතුරට හිමි ප්‍රවාහන දීමනාව සහ ඉන්ධන දීමනාව පමණක් ලබා දිය යුතු අතර අනෙකුත් තනතුරුවලට අදාළව ඉහත දීමනා හෝ නිල වාහන හෝ ලබා නොදිය යුතුය. අතිරේකව දරනු ලබන තනතුරුවලට අදාළව සේවා ස්ථානයෙන් බැහැරව යෙදෙන විශේෂ රාජකාරී සඳහා අතිරේක ඉන්ධන සැපයීම වෙනුවට ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුව සැතපුම් කුලිය ගෙවිය යුතුය.

v. ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධරයකු වුවද සේවා ස්ථානයෙන් බැහැර රාජකාරී සඳහා නිල වාහන හිමිකම ඇති නිලධරයන් කිහිපදෙනෙකු සමඟ එකම අවස්ථාවේ සහභාගී වන්නේ නම් ඔවුන්ට කණ්ඩායම් වශයෙන් ප්‍රවාහන පහසුකම් සලසා දිය යුතුය. ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ/ පළාත් ප්‍රධාන ලේකම්ගේ පෞද්ගලික අනුමතිය මත ඉන්ධන ප්‍රතිපාදන ලබා දිය හැකිය.

vi. 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හි 1:3 ඡේදයේ විධිවිධාන අනුව නිලධරයන්ට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දෙන අවස්ථාවේදී, ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධරයෙකුට එකී කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් භාවිතා කිරීම සඳහා කිසිදු හිමිකමක් නැත.

vii. ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධරයකු වැටුප් සහිතව හෝ වැටුප් රහිතව දින 30 කට වැඩි කාල සීමාවක් නිවාඩු ලබා ගන්නේ නම් එකී නිලධරයාට එම කාල සීමාව සඳහා ප්‍රවාහන දීමනාව හෝ ඉන්ධන දීමනාව නොගෙවිය යුතුය.

03. මීට අදාළ අනෙකුත් කොන්දේසි හා නියමයන් ඉහත පළමුවන ඡේදයේ සඳහන් වන චක්‍රලේඛයන්හි පරිදි ඉදිරියටත් බලාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2016 (I)

මගේ අංකය: EST-6/TPORT/05/5011
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2016.09.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## නිල වාහන සැපයීම වෙනුවට මාසික ප්‍රවාහන දීමනාව ගෙවීම.

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කළ 2016.03.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2016 හි 02 ඡේදයේ (i) අනු ඡේදය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී අනු ඡේදය පහත පරිදි සංශෝධනය කිරීමට 2016.08.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

(i) ප්‍රවාහන දීමනාව ලබා ගැනීමට පාවිච්චි කරනු ලබන වාහනය නිලධරයාගේ හෝ සිය කලත්‍රයාගේ නමින් ලියාපදිංචි කර තිබිය යුතුය. එතෙකුදු වුවත් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා පෞද්ගලිකව සෑහීමකට පත්වන්නේනම්, නිලධරයා විසින් කුලී පදනම මත හෝ බදු පදනම මත හෝ පාවිච්චි කිරීමට ගනු ලැබූ වාහනයක් වෙනුවෙන් ද මෙම මාසික ප්‍රවාහන දීමනාව ගෙවිය හැකිය.

03. මෙම විධිවිධාන 2016.08.09 දින සිට බලාත්මක වේ

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය